# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2159/64 - 2020 ජනවාරි මස 25 වැනි සෙනසුරාදා - 2020.01.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**

**ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ.**

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකායක් පිහිටුවීම :

1. එස්.බී. දිවාරත්න මැතිතුමා
   විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්
2. වි. සිවඥානසෝති මැතිතුමා
   විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්
3. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මැතිතුමා
   කැළණිය විශ්වවිද්‍යාලය
5. ආචාර්ය එස්.එස්. සිවකුමාර් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය
6. නිමල් අබේසිරි මැතිතුමා
   විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්
7. අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
   විශේෂඥ වෛද්‍ය

8. සංජීවනී හපුගොඩ මැතිතුමිය
   විශේෂඥ වෛද්‍ය
9. සුමේධ පෙරේරා මැතිතුමා
   විශ්‍රාමික මේජර් ජනරාල්
10. ගයාත්‍රි ගුණරුවන් මැතිතුමිය
    ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
11. සංජීව ගුණවර්ධන මැතිතුමා
    විධායක නිලධාරි, ඊ.ඩබ්ලිව්. ක්‍රේසි සහ සමාගම
12. සමන්ත කුමාරසිංහ මැතිතුමා
    අධිපති, නේචර්ස් සීක්‍රට් ආයතනය

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

පසුගිය කාල වකවානුව තුළ දේශීය ආර්ථික ශක්තීන්, ජාත්‍යන්තර සිද්ධාන්තයන් තුළ නිසි ඇගයීමකට ලක් නොවීම හේතුවෙන්, ග්‍රාමීය ජනතාව, වතු ප්‍රජාව හා නාගරික අඩු ආදායම්ලාභී ජනතාවගේ නිපුණතාවයන්, සුවිශේෂීතාවයන් හා ශක්‍යතාවයන් මෙන්ම, දුර්වලතා හා අභියෝගයන් නිසි තක්සේරුවකට ලක් නොවීම නිසා, එම ජනතාව අපේක්ෂා භංගත්වයට පත්ව ඇති බව වත්මන් රජයේ ප්‍රමුඛ අවධානයට යොමුවී ඇති හෙයින් ද,

තව ද, "ගම සමග පිළිසඳරක්" හා "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන් සකස් කිරීමේ දී ග්‍රාමීය හා අඩු ආදායම්ලාභී ජනතාවගේ දුෂ්කරතා, ගැටළු හා පසුබෑම් එකී ජනතාවගේම අදහස් ඇසුරින් වඩාත් නිවැරදි ආකාරයෙන් හඳුනාගෙන ඇති බැවින් ද,

ලෝක ආර්ථික ප්‍රවණතාවයන් තුළ, ඉදිරියේ දී ශ්‍රී ලංකාව ළඟා කර ගත යුතු සමස්ත ආර්ථික සංවර්ධන ඉලක්ක හා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගෙන ඇති සංවර්ධන අභිලාෂයන් මෙන්ම දුප්පත්කම හා ඇති නැති පරතරය වැඩිවීමේ ප්‍රවණතා වර්තමාන රජය විසින් පැහැදිලිව හඳුනාගෙන ඇති හෙයින් ද,

සුරක්ෂිතවූත්, සෞභාග්‍යමත්වූත් දේශයක් සඳහා එකී සංවර්ධන ආර්ථික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී දුප්පත්කම ප්‍රධාන පසුගාමී සාධකයක් බව ද, එහෙයින් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් පදනම් කරගත් ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීමේ ක්‍රමෝපායන්හි අවශ්‍යතාවය ද පැන නැගී ඇති බැවින් ද,

"සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් "සුරක්ෂිත රටක්", "සෞභාග්‍යමත් දේශයක්", "ඵලදායී පුරවැසියෙක්", "සතුටින් ජීවත්වන පවුලක්" යන තේමාවන් යටතේ එකම දැක්මක් තුළ දේශය ගොඩනැංවීම සඳහා ක්‍රියාත්මකවීමේ පැහැදිලි ඒකාබද්ධ වැඩපිළිවෙලක් ඉදිරිපත් කර ඇති හෙයින් ද,

අධ්‍යාපන පහසුකම් පුළුල් කරමින් ශිෂ්‍යයන්ගේ නිපුණතා හා කුසලතා දියුණු කිරීමේ වැඩ පිළිවෙල සඳහා මෙන්ම, ජනතාවගේ සෞඛ්‍යය, ගුණාත්මක ආහාර පරිභෝජනය හා පරිසර සංරක්ෂණය සඳහා ප්‍රමුඛත්වය දී ඇති හෙයින් ද,

මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් ස්ථාපිත රාජ්‍ය යාන්ත්‍රණය ඔස්සේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පුනර්ජීවනය කරමින් හා ග්‍රාමීය, වතු හා අඩුආදායම්ලාභී ජනතාව ව්‍යවසායකයන් වශයෙන් දේශීය ආර්ථික බල ගැන්වීමේ ක්‍රියාදාමයට සෘජුව සම්බන්ධ කර ගැනීම සඳහා උචිත පරිදි බැංකු හා මූල්‍ය ආයතන හරහා මූල්‍යමය ප්‍රතිපාදනයන් වෙත ළඟා වීමට ඇති අවස්ථා පුළුල්කර නව ප්‍රවේශයන් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. එස්.බී. දිවාරත්න මැතිතුමා
   විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්
2. වි. සිවඥානසෝති මැතිතුමා
   විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්
3. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මැතිතුමා
   කැළණිය විශ්වවිද්‍යාලය

5. ආචාර්ය එස්.එස්. සිවකුමාර් මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය
6. නිමල් අබේසිරි මැතිතුමා
   විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්
7. අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
   විශේෂඥ වෛද්‍ය
8. සංජීවනී හපුගොඩ මැතිතුමිය
   විශේෂඥ වෛද්‍ය
9. සුමේධ පෙරේරා මැතිතුමා
   විශ්‍රාමික මේජර් ජනරාල්
10. ගයාත්‍රි ගුණරුවන් මැතිතුමිය
    ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
11. සංජීව ගුණවර්ධන මැතිතුමා
    විධායක නිලධාරි, ඊ.ඩබ්ලිව්. ක්‍රේසි සහ සමාගම
12. සමන්ත කුමාරසිංහ මැතිතුමා
    අධිපති, නේචර්ස් සීක්‍රට් ආයතනය

දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා පිහිටුවනු ලබන කාර්ය සාධක බලකායෙහි සාමාජිකයින් ලෙස මෙයින් පත්කරනු ලබන අතර, මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මගේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත් කරමි :

(අ) සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය ආහාර සැපයුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(ආ) ආහාර හා අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම් ජාලය පුළුල් කිරීම පිණිස ලංකා සතොස, සතොස, සමුපකාර පද්ධතිය හා මාක්ෆෙඩ් ආයතනය සම්බන්ධීකරණය කිරීම,

(ඇ) ඉහත තොග ජාලය හරහා පහසු මිලට ආහාර හා අනෙකුත් භාණ්ඩ සැපයීමට දේශීය සැපයුම්කරුවන් දිරි ගැන්වීම හා සජීවීකරණය,

(ඈ) ලංකා සතොස, කෝප්-ෆෙඩ් හා මාක්ෆෙඩ් යන ආයතන හරහා සැපයීම් ජාලය පුළුල් කිරීම පිණිස බිම් මට්ටමේ දී බලයලත් වෙළෙඳ ජාලයක් ඇති කිරීම හා එහිදී කාන්තා ව්‍යවසායකත්වයට ප්‍රමුඛස්ථානයක් ලබා දීම,

(ඉ) රැකියා ලක්ෂයේ වැඩසටහන සඳහා හඳුනාගත් දුප්පත් පවුල් ලක්ෂයක් වෙත තිරසාර ජීවනෝපාය මාර්ග වැඩසටහන් ලබා දීම සහතික කිරීම පිණිස බහුකාර්ය කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණය,

(ඊ) මූලික වශයෙන් ග්‍රාමීය, වතු හා අර්ධ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන ජනතාවට ගුණාත්මක මාර්ග පද්ධතියක් සැපයීම සඳහා වන කි.මී. ලක්ෂයක ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මහාමාර්ග අමාත්‍යාංශය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා සමග සම්බන්ධීකරණය,

(උ) ග්‍රාමීය, වතු හා අර්ධ නාගරික ප්‍රදේශවල ජනතාව සෑහීමකට පත්වන අයුරින් ජල සැපයුම් 150,000 ක් ලබා දීම සහතික කරනු වස් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය සහ ජල සම්පාදන මණ්ඩලය සමග සම්බන්ධීකරණය,

(ඌ) සුළු පරිමාණ ව්‍යාපාර සංවර්ධනය, ස්වයං රැකියා, ගෘහාශ්‍රිත කර්මාන්ත සංවර්ධන මූලාරම්භයන් ප්‍රමුඛත්වයෙහි සළකමින් දුප්පත් හා අඩු ආදායම්ලාභී ජන කොට්ඨාසයන් වෙත මූල්‍ය පහසුකම් සලසා ගැනීම පිණිස මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සමෘද්ධි බැංකුව, සමුපකාර බැංකු, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථාව හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීම පහසු කිරීම,

(එ) දුප්පත් හා අඩු ආදායම්ලාභී ජනතාව අතරින් හඳුනා ගනු ලැබූ කෘෂිකාර්මික හා ව්‍යාපාර සංවර්ධනය සඳහා තිස් අවුරුදු බදු පදනම මත දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලක්ෂයක් ලබා දීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා "බිම් සවිය" වැඩසටහන සමග සම්බන්ධීකරණය,

(ඒ) බිම් මට්ටමෙහි සේවා සැපයුම් දුප්පත් හා අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත නිසි පරිදි ලබා ගැනීමට පහසුකම් සැලසී ඇති බව සහතික කිරීම පිණිස පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ අනෙකුත් රජයේ ආයතන සම්බන්ධීකරණය,

(ඔ) වන අලි තර්ජනවලින් ගම් සහ වගා බිම් ආරක්ෂා කිරීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය,

(ඕ) පෞද්ගලික අංශය විසින් සිදු කරනු ලබන ආයතනික සමාජ වගකීම් වැඩසටහන් (CSR) හැකිතාක් දුරට දිළිඳුබව තුරන් කිරීමේ ජාතික වැඩපිළිවෙලට සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම,

(ක) විවිධ ජාත්‍යන්තර බැංකු හා අරමුදල් මගින් ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා යොදා ගැනීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය සිදු කිරීම.

තව ද, එස්.බී. දිවාරත්න මැතිතුමා කාර්යසාධක බලකායෙහි සභාපතිවරයා ලෙස පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියකු විසින් පෙර කී කාර්යසාධක බලකාය විසින් පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙර කී කාර්යසාධක බලකාය වෙත මම මෙයින් නියම කොට විධාන කරමි.

තව ද, පෙර කී කාර්යසාධක බලකාය සිය නිල නියෝගය එක් වසරක කාලයක් තුළ සම්පූර්ණ කර මා වෙත වාර්තා කළ යුතු බව මෙයින් විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ජනවාරි මස 24 වන දින මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.